DOI : 10.31357/fhssmph.2011.00728

# ජංගම දුරකතන භාවිතය ආශ්‍රිත අපගාමී චර්යාංග

(Deviant behavior related to the mobile phone usage)

ජයවීර කංකානම්ගේ සුධීර

25 NOV 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා 2011.06.29 දින

අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය.

**අපේක්ෂකයාගේ ප්‍රකාශය**

දර්ශනපති අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන මෙම ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ් .එම්. ධනපාල මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පරීක්ෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

..............................

ජයවීර කංකානම්ගේ සුධීර

25/11/2011

දිනය

## නිබන්ධ උපදේශක වරයාගේ සහතිකය

ඉහත අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

..............................

ඩබ්.එම්.ධනපාල ,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

2011 - 6 - 29

..............................

දිනය

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

.....................................

ඩබ්.එම්.ධනපාල,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

.....................................

දිනය

## උපකාරානුස්මෘති


මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා සහය හා මගපෙන්වීම ලබාදුන් සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලය වෙනුවෙන් මගේ ස්තුතිය පුදමි. පශ්චාද් උපාධි පීඨයෙන් හා සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලයෙන් ලද සහයෝගය ඉතා අගයකොට සලකමි.පර්යේෂණය ඇරඹූ දා සිට නිමාවන තුරුම නිති පතා සාකච්ජා කරමින්, මග පෙන්වමින්, තේමාව තුළ විශද කළ හැකි සංකල්පීය මානයන් වෙත ඇරලවමින් සමාජ විද්‍යාවේ සහ අපරාධ විද්‍යාවේ රිද්මය කියාදුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහයන්ට ගෞරව පූර්වක ස්තුතිය පුදකරමි.

නිරන්තරයෙන් මා දිරිමත් කරමින් පර්යේෂණ ලෝකයෙන් පලා යා නොදී ශාස්ත්‍රීය ජීවිතය කෙරෙහි මා නැඹුරු කළ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දරයන් සිහිපත් කරනුයේ භක්ත්‍යාදරයෙනි. පර්යේෂණය පිළිබඳ විමසමින් හා විවිධ මූලාශ්‍රයන් හා පතපොත මතක්කර දෙමින් දිරිගැන්වීම් කළ මහාචාර්ය ටෙනිසන් පෙරේරා මෙහිලා අමතක කළ නොහේ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදයකුමාර අමරසිංහ මහතාට ස්තුතිවන්ත වෙමි. මේ පර්යේෂණය නිමාවන තුරු නොතිත් ආශාවෙන් බලා සිටි අද අප අතර සිටියානම් මේ පිළිබඳ බෙහෙවින් සතුටුවන මහාචාර්ය නන්දසේන රත්නපාල ඇදුරුතුමන් මට මෙහිදී සිහිපත් වෙයි.

පර්යේෂණ සහායකයින් ලෙස මට සහය වූ හැමටත්, පර්යේෂණ නිබන්ධය යතුරු ලියනය කළ ධම්මි මෙනවියටත් කෘතඥතාව පළකරමි. පර්යේෂණය එළිදකින තුරු බලාහිඳින මගේ හිතාදර මිතුරන් හැමදෙනාද මගේ සැහැල්ලුව බරක් කොට ගෙන මා වෙනුවෙන් වගකියන කිරිඳ හා මිතුරිය මිථිලාටද ස්තුති කරමි.

සුධීර ජයවීර

පටුන


| | පිටු අංකය |
|---|---|
| සංක්ෂිප්තය | xi- viii |
| **1.** පළමුවැනි පරිච්ඡේදය | |
| 1.1. හැඳින්වීම | 1-34 |
| 1.2. අධ්‍යයනයේ වැදගත්කම | 35-38 |
| 1.3. පර්යේෂණ ගැටළුව | 39 |
| 1.4. අධ්‍යයනයේ අරමුණු | 40 |
| 1.5. ක්‍රමවේදය | 40 |
| 1.5.1. මූලාශ්‍ර භාවිතය | 41-44 |
| 1.5.2. නියැදිය | 45-48 |
| 1.5.3. දත්ත විශ්ලේෂණය | 49 |
| 1.6. පර්යේෂණ සීමා හා ගැටළු | 49-51 |
| 1.7.නිබන්ධයේ ආකෘතිය | 51-52 |
| **2.** දෙවැනි පරිච්ඡේදය | |
| සාහිත්‍ය විමර්ශනය | 53-112 |
| **3.** තුන්වැනි පරිච්ඡේදය | |
| ජංගම දුරකතනයේ සුලභතාව, ව්‍යාප්තිය හා උපයෝගීතාව. | |
| 3.1. ජංගම දුරකතනයේ නැගීම | 110-116 |
| 3.2. ජංගම දුරකතනයේ විශ්වීය ව්‍යාප්තිය | 116-122 |
| 3.3. ශ්‍රී ලාංකේය සමාජය තුළ ජංගම දුරකතනයේ ව්‍යාප්තිය | 122-126 |
| 3.4. ශ්‍රී ලංකේය සමාජය තුළ ජංගම දුරකතනයේ පුද්ගල හා සමාජ උපයෝගීතාව | 126-156 |

**4.** හතරවැනි පරිච්ඡේදය

තත්කාලීන සමාජයේ ජංගම දුරකතන ආශ්‍රිත අපගාමී චර්යාංග


4.1. අපගාමීත්වය යනු කුමක්ද? 157-166

4.2. ජංගම දුරකතන භාවිතයේලා පැනනගින අපගාමී චර්යාංග 167

4.2.1. ජංගම දුරකතන යතුරු සිදුරු නැරඹුම්කාමය 168-174

4.2.2. ජංගම දුරකතන ආශ්‍රිත ප්‍රදර්ශන කාමුකත්වය 175-181

4.2.3. ජංගම දුරකතන ඇබ්බැහිය 181-190

4.2.4. අසභ්‍ය ඇමතුම් 190-193

4.2.5. හොරෙන් සවන්දීම 194-196

4.2.6. අසැබි දසුන් 196-201

4.2.7. වංචනික හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා 201-205

4.2.8. නොමනා භාවිතය 205-208

4.2.9. භාෂා භාවිතයේ අපගමනයන් 209-211

4.2.10. පරිසර දූෂණය හා ජංගම දුරකතනය 211-213

4.3. ජංගම දුරකතන භාවිතය විවිධ සමාජ ව්‍යුහයන් හා ඒකක තුළ මතුකරන අපගාමී ලක්ෂණ

4.3.1. ජංගම දුරකතන භාවිතය හේතුවෙන් පවුල තුළ පැනනගින අපගාමී ලක්ෂණ 213-215

4.3.2. අධ්‍යාපන සංස්ථාව තුළ ජංගම දුරකතන භාවිතය හේතුවෙන් පැනනගින අපගාමී ලක්ෂණ 216-218

4.3.3. මාර්ග ප්‍රවාහනය හා සංචරණයෙහිලා ජංගම දුරකතන විසින් ඇති කරන අපගාමීතා 219-223

4.3.4. ජංගම දුරකතන භාවිතය හේතුවෙන් කාර්යාල පරිශ්‍රයන් හා වැඩ සංස්කෘතිය තුළ පැනනගින අපගාමී ලක්ෂණ 223-225

4.3.5. ආගමික හා සංස්කෘතික අවස්ථාවන්හි ජංගම දුරකතනය භාවිතය ඔස්සේ මතුවන අපගාමීතා 225-229

**5. පස්වැනි පරිච්ඡේදය**

ජංගම දුරකතන ආශ්‍රිත අපගාමී චර්යාවන්ට තුඩුදෙන හේතුසාධක හා එහි සමාජ බලපෑම

5.1. ජංගම දුරකතන ආශ්‍රිත අපගාමීත්වය කෙරෙහි බලපාන හේතුසාධක හඳුනාගැනීම 230-245

5.2. ජංගම දුරකතන ආශ්‍රිත අපගාමීත්වයේ සමාජ බලපෑම 245-252

5.2.1. සමාජ පාලනය, සදාචාර ව්‍යවසායකත්වය හා ජංගම දුරකතන අපගාමීත්වය 253-256

6. පරිසමාප්තිය 257-261

7. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 262-277

## වගු, ප්‍රස්තාර, රූපසටහන් හා ඡායාරූප පටුන


| වගු | | පිටුව |
|---|---|---|
| 1. | ප්‍රශ්නාවලිය සඳහා තෝරාගත් නියැදිය | 46 |
| 2. | නිරීක්ෂණය සඳහා භාවිතයට ගත් ස්ථාන/ ආයතන හා අවස්ථා | 48 |
| 3. | ශ්‍රී ලංකාවේ ජංගම දුරකතන සබඳතා සංඛ්‍යාව 1992 -2009 | 123 |
| 4. | ශ්‍රී ලාංකික පවුල තුළ දරිද්‍රතාවයේ ස්වභාවය | 127 |
| 5. | පවුලේ ඥාතීන් අතර සන්නිවේදනය පවත්වාගැනීම සඳහා ජංගම දුරකතනයේ උපයෝගීතාව | 136 |
| 6. | ජංගම දුරකතන ආරක්ෂක උපාංගයක් ලෙස | 140 |
| 7. | හුදකලා අවස්ථාවකදී ජංගම දුරකතනය ළඟ තිබීම සහ එහි බලපෑම | 141 |
| 8. | එක් පුද්ගලයකු සතු ජංගම දුරකතන සබඳතා සංඛ්‍යාව | 143 |
| 9. | ජංගම දුරකතන භාවිතය හා පදිංචි ස්ථානයේ ස්වභාවය අතර සබඳතාව | 146 |
| 10. | ජංගම දුරකතනය ගමනාගමනය කෙරෙහි දක්වන බලපෑම | |
| 11. | මිතුරන් හා සමවයස් කණ්ඩායම් අතර සබඳතා පවත්වාගැනීම සඳහා ජංගම දුරකතනයේ උපයෝගීතාව | 150 |
| 12. | කිසියම් යතුරු සිදුරක් / දොරපියනක් හෝ සැඟවී ජංගම දුරකතනයකින් වීඩියෝ කළ දසුන්වල ප්‍රචලිත බව | 171 |
| 13. | ජංගම දුරකතන නැරඹුම් කාමයට ගොදුරුවීමේ ප්‍රවණතාව | 172 |
| 14. | ජංගම දුරකතන ආශ්‍රිත ප්‍රදර්ශන කාමුකත්වයට ගොදුරුවීමේ ස්වභාවය | 180 |
| 15. | ජංගම දුරකතනය අමතක වූ හෝ අතපසු වූ අවස්ථාවක දෛනික කටයුතු අඩාලවීමේ ස්වභාවය | 184 |
| 16. | ජංගම දුරකතන භාවිතය ඇරඹූ දා සිට භාවිත කාලයේ වෙනස්වීම | 186 |
| 17. | ජංගම දුරකතන භාවිත කාලයේ ඉහළයාම හා අධ්‍යාපන මට්ටම | 187 |
| 18. | ජංගම දුරකතනය ඔස්සේ අසභ්‍ය දුරකතන ඇමතුමකට ගොදුරුවීමේ හැකියාව | 192 |
| 19. | කාන්තාවන් අසභ්‍යමය ජංගම දුරකතන ඇමතුමකට ගොදුරුවීමේ හැකියාව | 193 |
| 20. | ජංගම දුරකතන මගින් අසභ්‍ය දර්ශන නැරඹීමේ ප්‍රවණතාව | 198 |

21. ජංගම දුරකතනය ඔස්සේ රැවටීමකට හෝ මුලාකිරීමකට ගොදුරුවීමේ ප්‍රවණතාව 202

22. ජංගම දුරකතන ඔස්සේ කටකතා ග්‍රාහකයින් බවට පත්වීමේ ප්‍රවණතාව 204

23. පාසලට දුරකතන රැගෙන එන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය 216

24. පංති කාමරයක් තුළ ගුරුවරුන්ගේ ජංගම දුරකතන භාවිතය 219

25. රිය පදවමින් සිටියදී ජංගම දුරකතන භාවිතයේ ස්වරූපය 220

26. රැස්වීම් / සභාවාර තුළ ජංගම දුරකතන භාවිතයේ ස්වරූපය 224

27. බෞද්ධ ආගමික සිද්ධස්ථාන තුළ ජංගම දුරකතන භාවිතය 226

ප්‍රස්තාර පිටුව

1. තුන්වන හා දෙවන පරම්පරාවේ ජංගම දුරකතනවල විශ්වීය ව්‍යාප්තිය 117

2. ලෝක ජනගහනයෙන් පුද්ගලයන් සියයක් සැලකීමේදී ජංගම දුරකතනයට දක්වන සබඳතා සංඛ්‍යාව හා එහි වර්ධන වේගය 118

3. 2007 – 2011 සංසරණය වූ SMS සංඛ්‍යාව මිලියනවලින් 118

4. සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේදයන්ගේ ව්‍යාප්තිය 120

5. ජංගම දුරකතනයේ ලෝක ව්‍යාප්තිය 122

6. 2001 – 2009 ජංගම දුරකතන ග්‍රාහකයින්ගේ වාර්ෂික වර්ධනයේ ප්‍රතිශතය 123

7. සන්නිවේදන ග්‍රාහකයින්ගේ සංවර්ධනය 2000-2001 124

රූපසටහන් පිටුව

1. ජංගම දුරකතනය, සමාජ ආකෘතික වෙනස්වීම හා අපගාමීත්වය 236

2. ජංගම දුරකතන භාවිතය ඔස්සේ, අරමුණු හා පිළිගත් මාර්ගයෙන් අපගමනය 243

ඡායාරූප පිටුව

1. මුල් කාලීන රේඩියෝ දුරකතන භාවිත කරනු ලැබූ වාහන 113

සංක්ෂිප්තය.

# ජංගම දුරකතන භාවිතය ආශ්‍රිත අපගාමී චර්යාංග

# (Deviant behavior related to the mobile phone usage)

ඉතිහාසය පුරා මානවයාගේ පැවැත්ම චිරස්ථායී කරනු පිණිස බලපෑ ප්‍රධාන සාධක අතර එකිනෙකා පවත්වාගත් අන්තර් ක්‍රියා කෙරෙහි වඩාත් සංකීර්ණ සන්නිවේදන හැකියාවන් බලපා තිබේ. මානව චර්යාවන් කෙරෙහි බෙහෙවින් බලපෑම් සහගත මෙවලමක් බවට ජංගම දුරකතනය වර්තමානයෙහි පත්ව ඇත. සන්නිවේදනය පමණක් නොව, අනෙකුත් මානව අවශ්‍යතා රාශියක් ආමන්ත්‍රණය කරන බහුකාර්ය උපකරණයක් බවට ජංගම දුරකතනය ප්‍රවර්ධනය වී තිබේ. මූල්‍යමය ගනුදෙනු, ආරක්ෂක අවශ්‍යතා. විනෝදාස්වාදය සපයන මෙවලමක් ලෙසත් ශ්‍රව්‍ය දෘශ්‍ය දත්ත ගබඩාවක් ලෙසත් එය භාවිත වෙයි. අන්තර්ජාලය සමඟ සෘජුව ගනුදෙනු කිරීමටත් රූපවාහිනී හා ගුවන්විදුලිය වැනි අනෙකුත් මාධ්‍යයන් සමඟ සබඳතා පැවැත්වීමටත් එයට හැකිය. කෙටි පණිවුඩ ක්‍රමය තුළින් කෙරෙන ජනමත විමසීම වැනි අන්තර් ක්‍රියා ස්වරූප තවත් අංශයකි.

ජංගම දුරකතන භාවිතයේදී පිළිගත් සාමාන්‍ය චර්යාවන් හැරුණු විට ඒ සමඟ පැනනඟින අපගාමී ස්වරූපයන්ද  හඳුනාගත හැකිය. සමාජ ක්‍රමය තුළ ස්ථාපිත, බෙදාහදාගත් හා ඇගයීමට පාත්‍ර අපේක්ෂාවන් බිඳ දමන විට එම චර්යාවන් අපගාමී වේ. (Cohen, 1966) අනුමත නොකරන ලද දිශානතියක ගමන්ගන්නා චර්යාව පොදුවේ සමාජය විසින් දරාගත හැකි උපරිමය ඉක්මවා යාම අපගාමීත්වයේ ස්වරූපය තීරණය කරයි. (Clinard, 1963). ජංගම දුරකතන භාවිතය තුළිනුත් පොදුවේ යහපත් යයි හඟින ධර්මතාවන් හා අගනාකම් උල්ලංඝනය වීම මෙහිදී අපගාමී යැයි හඳුනාගැනේ.

ශ්‍රී ලංකාව තුළ මිලියන 11 කට අධික ජංගම දුරකතන ග්‍රාහකයින් සංඛ්‍යාවක් සිටින අතර මානව භාවිතය සම්බන්ධයෙන් වේගවත් සංවර්ධනයක් උක්ත තාක්ෂණික මෙවලම විසින් ගොඩනඟා ඇත. අපගේ පර්යේෂණ ගැටලුව වන්නේ ජංගම දුරකතන භාවිතයේ මෙම වේගවත් ව්‍යාප්තියට හේතුව කුමක්ද? යන්න හඳුනා ගැනීමයි. මානව සමාජය විෂයෙහි කවර සුකෘත්‍යාත්මක අවශ්‍යතා සමූහයක් උපකරණයේ භාවිතය විසින් ආමන්ත්‍රණය කරන්නේද? කවර දුෂ්කෘත්‍යාත්මක අවශ්‍යතා සමූහයක් ජංගම

දූරකතනය මගින් ආමන්ත්‍රණය කරන්නේද? යන්න මූලික පර්යේෂණ ගැටලුව බවට පත්වේ. එය විමසා බැලීම සඳහා බහුවිධ පර්යේෂණ විධික්‍රම ඔස්සේ ක්‍රියා කරනු ලැබ ඇති අතර සංඛ්‍යාත්මක හා ගුණාත්මක පර්යේෂණ එළඹුම් භාවිතයට ගනු ලැබ ඇත. ප්‍රශ්නාවලි ක්‍රමය ඔස්සේ 560 ක පමණ වූ නියැදියක් පොකුරු නියැදි ක්‍රමය යටතේත්, පවුල, ආගම, අධ්‍යාපනය, ආර්ථිකය ආදී විවිධ සමාජ සංස්ථා නියෝජනය වන පරිදිත් තෝරාගෙන ඇත. ඊට අමතරව සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රමවේදය දත්ත රැස්කිරීම සඳහා ඉවහල් කරනු ලැබ ඇත.

නව්‍ය තාක්ෂණික උපාංගයක් සමාජගත වීමේදී පුද්ගලයා, සමාජ ක්‍රමය හා සංස්කෘතිය විෂයෙහි එය බලපානු ලබන ආකාරය පර්යේෂණය තුළින් අනාවරණය කෙරේ. පවත්නා ස්ථාපිත අගනාකම් හා ධර්මතා ප්‍රත්‍යාවර්ති ලෙස ව්‍යුහීකරණයට ලක් කෙරෙන ආකාරයත්, ස්ථාපිත අගනාකම් ඔස්සේ අපගාමීත්වය තීරණය වන ආකාරය හා ජංගම දූරකතන භාවිතය විසින් තනන නව සංස්කෘතික හා සමාජ පරිසරය තුළ ගොඩනැගෙන නව අගනාකම් හා ධර්මතා ඔස්සේ අපගාමී චර්යාව ප්‍රතිඅරුත් ගැන්වෙන ආකාරයත් පර්යේෂණය තුළ ප්‍රධාන සොයාගැනීම් ලෙස ඉදිරිපත් කෙරේ. එසේම සමාජය තුළ පිළිගත් මාර්ගයන් ඇහිරී ඇති විට ඉන් අපගමනය වූ මාර්ගයක ගමන් ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් ළඟා කරගන්නා ආකාරය ජංගම දූරකතනය කේන්ද්‍ර කරගනිමින් සොයා ගනු ලැබ ඇත. ශ්‍රී ලාංකේය සමාජය තුළ සදාචාර ව්‍යවසායකයාගේ භූමිකාව හා සමාජ වෙනස්වීම් හමුවේ අපගමනය වන මානව චර්යාවන් කෙරෙහි ඔවුන්ගේ බලපෑම් ස්වභාවයත්, සමාජ පාලනය විෂයෙහි එහි ඇති වැදගත්කමත් පර්යේෂණය තුළින් අනාවරණය කෙරේ. ජංගම දූරකතනය ආශ්‍රය කරගනිමින් බිහිවන නිරපේක්ෂ අපගාමීත්වය පාදක කරගනිමින් සමස්ත නිබන්ධනය සැකසී ඇත.

ස්ථාපිත සමාජ ආකෘතීන් අභියෝගයකට ලක් කිරීම සඳහා ජංගම දූරකතන ආශ්‍රිත අපගාමී චර්යාවන්ගේ බලපෑම මෙහිදී විමර්ශනයට ලක්ව ඇත. පුද්ගල පෞරුෂය කෙරෙහි ජංගම දූරකතන භාවිතය බලපානු ලබන ආකාරයත්, එකී නව තාක්ෂණය විසින් ආධිපත්‍යය පතුරවන්නා වූ සමාජ ක්‍රමයක් තුළ ඉපදී හැදී වැඩෙන, සමාජානුයෝජනය වන පුද්ගලයන් හා ඊට පෙර පැවති සමාජ ක්‍රමය තුළ ජීවත් වූ පුද්ගලයන්ගේ පෞරුෂ ස්වභාවය හා අන්තර්ක්‍රියා ස්වරූප අතර ඇතිවන පරස්පරය හඳුනාගැනීම අනාගත පර්යේෂණ හා අධ්‍යයනයන් සඳහා ඉඩ හසර වෙන්කරන බව හඳුනා ගැනේ.

යතුරු පද :- ජංගම දූරකතනය, අපගාමීත්වය, අගනාකම්, සාරධර්ම.

පරිච්ඡේදය

# 1

# ජංගම දූරකතන ආශ්‍රිත අපගාමී චර්යාංග

## 1.1 හැඳින්වීම.

මිනිස් පැවැත්ම චිරස්ථායි කරනුවස් ලෝක ඉතිහාසය පුරා බලපෑම් සහගත වූ සාධක අතර මානව සන්නිවේදන හැකියාවන්ට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. "මානව සන්නිවේදනය" අන්තර්පුද්ගල සන්නිවේදනයේ සිට මිලියන සංඛ්‍යාත ජන රාශීන් වෙත, සමූහයන් වෙත කෙරෙන පොදු ආමන්ත්‍රණයක් දක්වා වූ අතිශය පුළුල් පරාසයක පැතිරෙමින් මානව සමාජයේ විවිධ අවශ්‍යතා හසුරවනු ලබන්නා වූ ප්‍රධාන බලවේගයක් ලෙස ක්‍රියා කරන බව නොරහසකි. සමාජ අන්තර් ක්‍රියාවන් පවත්වාගැනීම කෙරෙහි භාෂාව මූලික වූ සන්නිවේදන උපක්‍රම නිරන්තරයෙන් අවශ්‍ය වේ. නූතන සමාජ පරිසරය තුළ අන්තර් පුද්ගල සන්නිවේදනය කුළු ගන්වන කේන්ද්‍රීය තාක්ෂණික උපකරණය බවට ජංගම දූරකතනය පත්ව ඇතැයි කීවොත් එය නිබොරුය. "ලෝක ඉතිහාසය තුළ වඩාත් වේගයෙන් පැතිර ගිය තාක්ෂණය ජංගම දූරකතනය වේ." ( Arminen,2007) "බොහොමයක් කාර්මික වශයෙන් සංවර්ධිත රටවල ජංගම දූරකතන හිමිකාරීත්වය එහි මුළු ජනගහණයෙන් සියයට හැත්තෑව ඉක්මවන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල තත්වය ද ඊට ඉතා සමීප මට්ටමක පවතී. (Ling, 2004) හුදු සන්නිවේදනයෙන් ඔබ්බෙහි විවිධාකාර මානව චර්යාවන් විෂයෙහි අතිශය බලපෑම් සහගත මෙවලමක් බවට ජංගම දූරකතනය පත්ව තිබේ. සමාජ වෙනස්වීම් කෙරෙහි ඍජු මැදිහත්වීමක් ඇති කරන නව්‍ය තාක්ෂණික උපාංගයක් ලෙසත් මානව ජීවිතයේ නන්විධ කෘත්‍යාත්මක අවශ්‍යතා උදෙසා බෙහෙවින් ඉවහල්වන මෙවලමක් ලෙසත් ජංගම දූරකතනය හැඳින්විය හැකිය. සමාජ සාමූහිකත්වය (Social collectiveness) සහ සමාජ සංස්ථාවන්ගේ (Social institutions) පැවැත්ම සඳහා සන්නිවේදනය විසින් විශාල දායකත්වයක් සපයා ඇත. විවිධ සමාජ කෘත්‍යයන්හිලා පරිණාමීය වැදගත්කමකින් යුතුව, සමාජයීය විද්‍යා විෂය ධාරාවන්ට අදාළව,

අධ්‍යයනය සඳහා වූ නව විවර වීමක් 'ජංගම දුරකතනය'' තාක්‍ෂණික උපාංගයක් ලෙස සමාජ ගතවීමත් සමඟ උදාවී ඇත්තේය. සමාජ බන්ධනයන්ගේ ශක්තිමත්භාවය උරගා බලනු ලබන්නාවූත්, එකී සමාජ සංස්කෘතික භාවයන් අන්තර් ක්‍රියාවන්, ආකෘතීන්, විෂයෙහි බලපෑම් සහගත වන පිළිගත් සාරධර්ම, අගනාකම් හා නෛතික වාරණයන්ට විටෙක අභියෝග කරන්නාවූත් ප්‍රතිපක්‍ෂ ලෙස සමාජ සංස්කෘතික භාවයන්, ස්ථාපිත සමාජ ව්‍යුහයන් ශක්තිමත් කරන්නාවූත් අපූර්ව සන්නිවේදන මෙවලමක් බවට ජංගම දුරකතනය පත්ව ඇත. සමාජ අනුකලනය (Social integration) හා සමාජ ඒකාබද්ධතාව (Social cohesion) විෂයෙහි ජංගම දුරකතනය විසින් සිදුකර තිබෙන බලපෑම සුළු පටු එකක් ලෙස සැලකිය නොහැකිය.

ජංගම දුරකතනය විසින් ඇති කරන කෘත්‍යාත්මක බලපෑම යම් සමාජ ව්‍යුහයක් කෙරෙහි එය වඩාත් ස්ථාවරව පවත්වාගෙන යාමට හේතුවන්නේද? නැතහොත් එමගින් පිළිගත් සාරධර්ම හා සමාජ සම්මුතීන් අභිබවනය කරනු ලබමින් සමාජ ක්‍රමයේ රිද්මිත චලනය හදිසි කැළඹීමකට නතුකර තිබෙන්නේ ද යන්න සොයා බැලීම අප හමුවේ ඇති ගැටලුවයි. මානව චර්යාවන්ගේ ස්වභාවය, පුරුදු පුහුණු විෂයෙහි එමගින් ඇති කර තිබෙන්නේ කවරාකාර බලපෑමක්ද, නැතහොත් වෙනසක් ද යන්න විමසා බැලිය යුතුව ඇත. උපරිව්‍යුහය තුළ පෙනෙන්නට ඇති වෙනස්කම් සමාජ වෙනස්වීමේ, සංස්කෘතික ප්‍රකාශනයන් (Culutural expression) ලෙස සලකමින් ද පිළිගත් මානයන්ගෙන් ඔබ්බෙහි ජංගම දුරකතනය භාවිත කරනු ලැබීමෙන් සමාජ ක්‍රමය (Social system) කෙරෙහි ඇති කෙරෙන බලපෑම, එකී සමාජ ක්‍රමය දුර්වල කිරීමට හෝ හානි කිරීමෙහි සමත්වේද? එසේ නම් ඒ කවර ආකාරයන් යටතේද? නොඑසේනම් තවදුරටත් එවැනි වෙනස්වීම් සමාජ ක්‍රමය තහවුරු කිරීමේලා උපකාරී වන්නේද ආදී සමාජ විද්‍යාත්මක විග්‍රහයන් ගණනාවක් උක්ත තාක්‍ෂණික උපාංගයේ සමාජ භාවිතය විසින් අප හමුවේ තබයි.

වසර මිලියන ගණනකට ඉහත සිටම මානව පරිණාමය හැඩගැස්වීමේලා බලපෑම් සහගත වූ ප්‍රධාන සාධකයකි භෞතික සමීපත්වය. (Physical proximity) 'භෞතික සමීපත්වය' මානව ක්‍රියාවන් සඳහා මුල පිරීමටත් ඒවා පවත්වාගෙන යාමෙහිත් තීරණාත්මක සාධකයකි. ස්ථාවර වාසස්ථාන විසින් වඩාත් සංකීර්ණ සන්නිවේදන ආකාරයන් ආරම්භ කිරීමටත් පවත්වාගෙන

යාමටත් මිනිසා පොළඹවා ඇත. ඒ ඒ භෞතික සාධකවල පැවැත්ම හා මානව ජීවිතයේ අවශ්‍යතා සඳහා සම්පත් කළමනාකරණය කරගැනීමේ අවශ්‍යතාවත්, ස්ථාවර වාසස්ථාන ගතවීමත් ( Stable dwelling places) සංචරණය නමැති මානව ක්‍රියාව මත ඇති කර තිබෙන බලපෑම මානව සන්නිවේදනයේ මාදිලීන් හා ක්‍රමවේදයන් තීරණයවීම උදෙසා ප්‍රබල ලෙස බලපා තිබේ. කිසියම් ජන සමූහයක් යම් නිශ්චිත කාල පරාසයක් නිශ්චිත භෞමික සීමාවන් තුළ වාසය කිරීමෙන් උත්පාදනය වන සමාජයීය ගති ස්වභාවයන් විසින් ප්‍රකට කරන අනන්‍යතර ලක්ෂණ විෂයෙහි සන්නිවේදනය විසින් සිදු කරන බලපෑම විශේෂ වැදගත් කමකින් යුතු වෙයි. සමාජ සමූහය තුළ පිළිබිඹුවන ජාතිකත්වය, ආගම, වර්ගය හා භාෂාව ආදී විවිධ වෙනස්කම් තුළ මෙන්ම සමාජ සාමූහිකත්වය ( Social collectiveness) හා විවිධ සමාජ සංස්ථාවන් ( Social institutons) පවත්වාගෙන යාම සඳහා සන්නිවේදන උපක්‍රම විශාල දායකත්වයක් සපයා ඇත. එකම භෞතික වටපිටාවක් තුළ වඩාත් දිගු කාලයක් සබඳතා පවත්වා ගනිමින් ජීවත්වීම සඳහාත්, සමාජ ස්ථාවරත්වය තහවුරු කරනු ලැබීම උදෙසාත් සන්නිවේදනය විශාල වශයෙන් දායක වේ. ශිෂ්ටාචාරගත මානව ජීවිතය සැලකීමේ දී දිගු කාලයක් ස්ථාවර වාසස්ථානවල රැඳී සිටීමේ වැදගත්කම ඉතිහාසමය සාක්ෂි මගින් තහවුරු කොට තිබේ. දෙගම්මැදි, ඊජිප්තු හෝ හොවැංහෝ ශිෂ්ටාචාර සැලකීමේදී එවායේ නැගීම සඳහා ඔවුන්ගේ ස්ථිර වාසස්ථානමය ස්වභාවය හේතුවිනැයි කිව හැකිය. නූතන මානව සමාජයේ ශිෂ්ටාචාරගත ජීවිතය සැලකීමේදීද ස්ථිර වාසස්ථානමය පැවැත්මක් සඳහා වූ මිනිස් කැමැත්ත අද්විතීය කරුණක් බව පෙනී යයි. නූතන නාගරික අවකාශයන් තුළ චිරස්ථිතික වන සමාජ ජීවිතය සැලකූ විට ඊට බලපෑ ඇති භෞතික සන්නිකර්ෂණාත්මක හේතු සාධක හසුරුවමින් මානව ජීවිතයේ බහුවිධ සමායෝජනයන් කෙරෙහි විද්‍යුත් සන්නිවේදනය විසින් පුළුල් පරාසයක පැතිරුණු කෘත්‍යාත්මක උපයෝගීතාවක් සපයනු දැකිය හැකිය. කාර්මික කරණයට ලක්වූ විශාල ජනගහණයක් සහිත නාගරික අවකාශයන්ගේ භූමි ප්‍රදේශයන්හි විවිධාංගීකරණයට හා සංකීර්ණත්වයට පත් සමාජ ස්වභාවයන් තුළ වැඩි වැඩියෙන් සන්නිවේදන අවශ්‍යතාවන් පැනනගින අතර ඒවා අභිමුඛ නව සන්නිවේදන ක්‍රමවේදයන් හා උපක්‍රම ඉල්ලා සිටිනු ලැබේ. ඉහත සමාජ සංවර්ධනය වෙනුවෙන් පොදුවේ අභ්‍යුපගමනය කරන තත්වයන්ට පාදකව ඇත්තේ එකී සමාජයේ ස්ථාවර භූගෝලීය පැවැත්ම හා සමගාමීව